සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

40 S I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **පෙරදිග සංගීතය I** කාලය පැය දෙකයි (I/II කොටස)

- ප්‍රශ්න 40 ටම පිළිතුරු සපයන්න.

1 සර්ව කෝමල රාගයක් වන්නේ,
**(i)** යමන් **(ii)** කාෆි **(iii)** බිලාවල් **(iv)** භෛරවි

2. එක් ස්වරයක් විකෘති වන ග, නි වාදී සංවාදී වන රාගය වන්නේ,
**(i)** යමන් **(ii)** භූපාලි **(iii)** කාෆි **(iv)** බිලාවල්

3. ''පාරමිතා බල පූරිත පූජිත'' ගීතයට පාදක වූ හින්දුස්ථානි රාගය වන්නේ,
**(i)** යමන් **(ii)** භෛරවී **(iii)** කාෆි **(iv)** භූපාලි

4. නි̣ රි ස , නි̣ රි ග රි ස, .................. මෙහි ඊළඟ ස්වර ඛණ්ඩය අදාල රාගයට අනුව ලියා දැක්වීමේ දී නිවැරදි වරණය වන්නේ
**(i)** නි̣ රි ග ම ග රි ස **(ii)** ග ප ධ නි සං **(iii)** නි̣ රි ග ම̍ ග රි ස **(iv)** ග රි නි̣ රි ස

5. ප්‍රකෘති ස්වර සියල්ලම යෙදෙන රාගයකි,
**(i)** භූපාලි **(ii)** බිලාවල් **(iii)** කාෆි **(iv)** යමන්

6. ස්වර වලින් පමණක් සමන්විත ගීත විශේෂයකි.
**(i)** ඛ්‍යාල් **(ii)** භජන් **(iii)** සර්ගම් **(iv)** වංග

7. | xx | xxx | xx | xxx | මෙසේ මාත්‍රා කැටිවන හින්දුස්ථානි තාලය වන්නේ,
**(i)** දාදරා තාලය **(ii)** කෙහෙර්වා **(iii)** ත්‍රිතාලය **(iv)** ජප් තාලය



ඉහත බටහිර ප්‍රස්තාරය ඇසුරෙන් පහත සඳහන් 8, 9, 10 ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සළකුණු කරන්න

8. මෙහි තාල සංකේතය හෙවත් **(Time signature)** වන්නේ,
**(i) 4/4** **(ii) 3/4** **(iii) 2/4** **(iv) 6/8**

9. ඉහත ප්‍රස්තාරයට අදාල ස්වර වන්නේ,
**(i)** ගමප/මපධ **(ii)** සරිග /රිගම **(iii)** පධනි/ ධනිස **(iv)** සරි / සරිගම

10. මෙම ප්‍රස්තාරය සඳහා යොදාගෙන ඇති ස්වර සංකේතය වන්නේ,
**(i)** සෙමිබ්‍රීව් **(ii)** මිනිම් **(iii)** ක්‍රොචට් **(iv)** ක්වේවර්

11. ♪, o, ♩ මෙම සංකේත පිළිවෙලින් වන්නේ,
**(i)** ක්‍රොචට්, සෙමිබ්‍රීව්, මිනිම්ය **(ii)** සෙමිබ්‍රීව්, මිනිම්, ක්‍රොචට් ය
**(iii)** ක්වේවර්, සෙමිබ්‍රීව්, ක්වේවර් **(iv)** ක්වේවර්, සෙමිබ්‍රීව්, ක්‍රොචට් ය

12. \ස-ස ග-ග \ප-ප සීසී-\ මෙම ස්වර ලිපියට අදාල හින්දුස්ථානි සහ බටහිර තාලය වන්නේ,

**(i)** බෙම්ටෝ , 6/8 **(ii)** කෙහෙර්වා, 4/4 **(iii)** ජප් , 5/8 **(iv)** දීප්චන්දි ,7/8

13. බොක්ස් ගිටාරයක විවෘත තත් පිළිවෙලින් නම් කිරීමේ දී නිවැරදි වරණය වන්නේ,

6 5 4 3 2 1 | 6 5 4 3 2 1 | 6 5 4 3 2 1 | 6 5 4 3 2 1

**(i) E B G D A E** **(ii) A B C D E F** **(iii) G D A E C F** **(iv) D A E G B E**

14. දේශීය සංගීත භාණ්ඩ වර්ගීකරණයේ දී විතතාතත ගණයට ගැනෙන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,

**(i)** රබාන යි. **(ii)** ගැට බෙරයයි **(iii)** තම්මැට්ටමයි **(iv)** දවුලයි

15. යමන් රාගය ආශ්‍රිත සරල ගීතයකි.

**(i)** සැදෑ අඳුර ලොව **(ii)** සාදු දන්ත දා **(iii)** ගුමු ගුමුව වදුලේ **(iv)** රුක් අත්තන මල

16. කුවේණි නාට්‍යයේ ගීතයකි,

**(i)** කුමට ද සොබනියෙ **(ii)** අන්න බලන් සඳ **(iii)** සත් සියක් කපු මල් **(iv)** සෝබාව දේ

17. තබ්ලා වාදනයක ඇති අංගයකි,

**(i)** ස්ථායි - අන්තරා **(ii)** තාන් **(iii)** ජලා **(iv)** කායදා

18. එස් රාජයේ වැඩි දියුණු කරන ලද්දේ,

**(i)** රවීන්ද්‍රනාත් තාගෝර් **(ii)** ඊශ්වරී රාජ්

**(iii)** අමීර් කුෂ්රු **(iv)** ඇන්ටෝනියෝ ස්ට්‍රැඩිවේරි

19. සිතාරයේ ප්‍රධාන තත හඳුන්වන්නේ,

**(i)** සයාහි **(ii)** තුම්බා **(iii)** නායකීතාර් **(iv)** ලංගෝට්

20. ජප් තාලය ආවර්ත දෙකක් වැයීමේ දී ලැබෙන මාත්‍රා ගණන වන්නේ,

**(i)** 20 **(ii)** 16 **(iii)** 14 **(iv)** 10

21. ත්‍රිතාලයේ ඛලි ස්ථානයට හිමි මාත්‍රාව වන්නේ,

**(i)** පළමු මාත්‍රාවය **(ii)** 13 මාත්‍රාවය **(iii)** 5 මාත්‍රාවය **(iv)** 9 මාත්‍රාවය

22. **F** මේජර් කෝඩ් එකට අදාල ස්වර වන්නේ,

**(i) C, E, G** **(ii) F, A, C** **(iii) D , F , A** **(iv) G, B, D**

23. හින්දුස්ථානි ඛ්‍යාල් ගීතයක ප්‍රධාන කොටස් 2 වන්නේ,

**(i)** ආරෝහණ /අවරෝහණ **(ii)** වාදී/ සංවාදී **(iii)** ස්ථායි/ අන්තරා **(iv)** ගමක්/ මීන්ඩ්

24. ජන ගී වර්ගීකරණයට අනුව ගැනෙන මෙහෙ ගීයක් වන්නේ,

**(i)** පතල් ගී **(ii)** තුන්සරණේ ගී **(iii)** ඔංචිලි වාරම් **(iv)** රබන් ගී

25. නව නාට්‍ය ගීතයකි.

**(i)** ලෝනා මුණි රාජගේ **(ii)** දී කිරි දී කිරි **(iii)** සුවඳ පත්ම **(iv)** ආලෙ බැන්ද

26. මද්දලය තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගන්නා නාට්‍ය ශෛලිය වන්නේ,

**(i)** නූර්ති **(ii)** නව නාට්‍ය **(iii)** නාඩගම් **(iv)** සොකරි

27. පහත රට බෙරය හඳුන්වන තවත් නමකි.

**(i)** සෝෂක බෙරය **(ii)** ගැට බෙරය **(iii)** උඩරට බෙරය **(iv)** දවුල

28. ජන ගී ආශ්‍රිත සරල ගීතයකි,

**(i)** මල් සරා බැල්ම හෙලා **(ii)** අම්මා සඳකි **(iii)** දන්න වංහුං **(iv)** සෝබාව දේ

29. විද්‍යුත් තාල වාද්‍ය භාණ්ඩයකි

**(i)** ඕගන් **(ii)** පියානෝ **(iii)** ඩ්‍රම්ස් **(iv)** ඔක්ටපෑඩ්

30. අවග්‍රහයෙන් පටන් ගන්නා ගීතයකි,
(i) දන්නෝ බුදුන්ගේ (ii) ලංකා ලංකා (iii) හෙළ ජාතික (iv) දිය ගොඩ සැම තැන

31.  යන සළකුණ හඳුන්වන්නේ,
(i) **Repitation Mark** යනුවෙනි (ii) **Sign to Sign** යනුවෙනි
(iii) **Intro** යනුවෙනි (iv) **Interlude** යනුවෙනි

32. ''නිති විඳිමු සුමධුර යමන රාග රස'' යනු යමන් රාගයේ,
(i) මධ්‍යලය ගීතයකි (ii) සර්ගම් ගීතයකි (iii) ලක්ෂණ ගීතයකි (iv) විලම්භලය ගීතයකි

33. ''සර්ගම් ගීත'' හඳුන්වන තවත් නාමයකි,
(i) ස්වර මාලිකා (ii) පල්ටා (iii) තානාලංකාර (iv) ස්වර සංගති

34. රාගයකට අදාල නොවූව ද රාග රසය වැඩි කර ගැනීම සඳහා යොදා ගනු ලබන ස්වර හඳුන්වන්නේ,
(i) වාදී (ii) සංවාදී (iii) වර්ජ (iv) විවාදි

35. හින්දුස්ථානි තාලයක අප්‍රාණික ආඝාතය හඳුන්වන්නේ,
(i) සමග්‍රහය යනුවෙනි (ii) ඛලිය යනුවෙනි
(iii) අනුතාල ස්ථාන යනුවෙනි (vi) විභාග යනුවෙනි

36. දොං ජිංත ගත දොංත යන බෙර පදය අයත් දේශීය තිත වන්නේ,
(i) මහ තනි තිතයි (ii) සුළු තනි තිතයි (iii) සුළු මැදුම් දෙතිතයි (iv) මැඳුම් මහ දෙතිතයි

37. එස්රාජ් වාදනයෙහි ප්‍රකට භාරතීය වාදන ශිල්පියෙකි,
(i) යෙහුදි මෙන්හුයින් (ii) අසීස් චන්ද්‍ර බැනර්ජි (iii) අමීර් කුෂ්රු (iv) රවිශංකර්

38. උඩරට වන්නමකි,
(i) කෝකිල (ii) තිසරා (iii) උකුසා (iv) වෛරෝඩි

39. වෙස් මුහුණු පැළඳ රඟ දක්වනු ලබන නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,
(i) කෝලම් (ii) සොකරි (iii) නූර්ති (iv) නාඩගම්

40. සරළ ගීතයක කොටස් පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) **Chorus, Interlude, Introduction, Verse**
(ii) **Introduction, Chorus, Interlude, Verse**
(iii) **Verse , Introduction, Chorus, Interlude,**
(iv) **Interlude, Chorus , Verse , Introduction**

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

40 S II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018
First Term Test - Grade 10 - 2018

විභාග අංකය .................................... **පෙරදිග සංගීතය II** කාලය පැය දෙකයි (I/II කොටස)

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. **(i)** භෛරවී රාගයේ වාදී ස්වරය කුමක් ද ?
**(ii)** යමන් රාගයේ ගායන සමය ලියන්න.
**(iii)** පෙරදිග ක්‍රමය අනුව වයලීනය සුසර කරන ස්වර ලියන්න.
**(iv)** කෝලම් රඟ දක්වනු ලැබූ ස්ථානය හඳුන්වන්නේ කුමන නමකින් ද?
**(v)** කාෆි රාගයේ අනුවාදී ස්වර ලියා දක්වන්න.
**(vi)** හින්දුස්ථානි තාලයක් තුල තිබිය යුතු අවම විභාග ගණන කීයද ?
**(vii)** දීප්චන්දි තාලයට අදාල බටහිර ටයිම් සිග්නේචරය ලියා දක්වන්න.
**(viii)** ශ්‍රී ලාංකික ප්‍රවීණ තබ්ලා වාදකයෙකුගේ නම ලියන්න.
**(ix)** මහනුවර යුගයේ කවිකාර මඩුව ආශ්‍රිතව නිර්මාණය වූවා යැයි සැලකෙන ගීත විශේෂය කුමක් ද?
**(x)** ''සඳවා සුදු වැලි පිවිතුරු'' ගීත පාදයේ සඳැස්මත් ගණන කීය ද?
**(xi)** සිතාරය වාදනය කිරීම සඳහා යොදා ගනු ලබන උපකරණය කුමක් ද?
**(xii)** වයලීන් පවුලට අයත් කුඩාම භාණ්ඩය සහ විශාලම භාණ්ඩය හැර අනෙක් භාණ්ඩ 2 නම් කරන්න.
(ලකුණු 12)

02. **(i)** මාත්‍රා 16 කින් යුත් හින්දුස්ථානි තාලය නම් කරන්න
(ලකුණු 02)
**(ii)** එම තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න
(ලකුණු 05)
**(iii)** එම තාලයට අනුරූප දේශීය තිත නම් කර ප්‍රස්තාර කරන්න.
(ලකුණු 05)

03 **(i)** භෛරවී හෝ යමන් රාගයේ විස්තරය ලියා දක්වන්න
(ලකුණු 06)
**(ii)** තෝරා ගත් රාගය හැර ඉතිරි රාගයේ මධ්‍යලය ගීතය ගීත ස්වර ප්‍රස්තාර කරන්න
(ලකුණු 06)

04. | ප ප ම ම | ග ග රි රි | ස රි ග ම | ප - - - |

**(i)** ඉහත ගී පාදය පංචම භාවයෙන් ලියා දක්වන්න
(ලකුණු 04)
**(ii)** ස්වර සප්තකය මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න
(ලකුණු 04)
**(ii)** කාෆි රාගයේ ආරෝහණ ස්වර මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න
(ලකුණු 04)

05 |ස රි ග ග | ග - ග - |ම ග ම ග|ම ග රි -|

**(i)** ඉහත ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට අනුව ලියා දක්වන්න.

(ලකුණු 05)

**(ii)** එම ප්‍රස්තාරයට ගැලපෙන ටයිම් සිග්නේචරය යොදන්න.

(ලකුණු 02)

**(iii)** මෙම ප්‍රස්තාරය සඳහා ඔබ යොදාගත් බටහිර ස්වර සංකේත නම් කරන්න.

(ලකුණු 05)

06. **(i)** ගිටාරයේ දළ රූප සටහනක් ඇඳ එහි විවෘත තත් මත ස්වර පිහිටන අයුරු ලියා දක්වන්න

(ලකුණු 04)

**(ii)** තබ්ලාවක් ඇඳ එහි කොටස් 6 ක් නම් කරන්න.

(ලකුණු 04)

**(iii)** තබ්ලාවෙහි කොටස් දෙකෙන් උපදවා ගත හැකි අක්ෂර 4 ක් ලියා දක්වන්න.

(ලකුණු 04

**7.** **(i)** නූර්ති රංග සම්ප්‍රදාය පිළිබඳ විශේෂ ලක්ෂණ 4 ක් ලියා දක්වන්න.

(ලකුණු 04)

**(ii)** ශ්‍රී ලාංකික නූර්ති නාට්‍ය කරුවන් දෙදෙනෙකු නම් කරන්න

(ලකුණු 04)

**(iii)** ඔබ දන්නා නූර්තියක් නම් කර එම නූර්තියට අයත් ගීතයක මුල් කොටස ලියා දක්වන්න

(ලකුණු 04)

පළමු වාර පරීක්ෂණය - 2018
පෙරදිග සංගීතය - 10- ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | -4 | 11 | - 4 | 21 | - 4 | 31 | - 2 |
| 2 | -1 | 12 | - 1 | 22 | - 2 | 32 | - 3 |
| 3 | -2 | 13 | - 1 | 23 | - 3 | 33 | - 1 |
| 4 | -3 | 14 | - 4 | 24 | - 1 | 34 | - 4 |
| 5 | -2 | 15 | - 2 | 25 | - 2 | 35 | - 2 |
| 6 | -3 | 16 | - 3 | 26 | - 3 | 36 | - 3 |
| 7 | -4 | 17 | - 4 | 27 | - 1 | 37 | - 2 |
| 8 | -2 | 18 | - 2 | 28 | - 1 | 38 | - 3 |
| 9 | -1 | 19 | - 3 | 29 | - 4 | 39 | - 1 |
| 10 | -3 | 20 | - 1 | 30 | - 1 | 40 | - 2 |

## II කොටස

01 **(i)** ම

**(ii)** රාත්‍රී පළමු ප්‍රහාරය

**(iii)** ප ස ප සී (ම ස ප රි)

**(iv)** තානායම්. පොළ ·

**(v)** රි ග ම ධ නි

**(vi)** දෙකකි

**(vii)** 7/8

**(viii)** ඩී.ආර්. පීරිස් , විජේරත්න රණතුංග

**(ix)** ප්‍රශස්තිය , වන්නම්

**(x)** 12 යි

**(xi)** මිස්රාබ්

**(xii)** 1 වියෝලා 2 චෙලෝ

(ලකුණු 12)

2. **(i)** ත්‍රි තාලය (ලකුණු 2)

**(ii)**

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාල සංඥා | x | | | | 2 | | | | 0 | | | | 3 | | | | x |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 1 |
| ඨේකාව | ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා | ධා |

(ලකුණු 5)

**(i)** මහ තනි තිත

බෙර පදය

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තිත් සංඥා | / | | | | / | | | | | | | | | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | | | | | | | | |
| උඩරට | දො | මි | කි | ත | කි | ත | දො | ං | | | | | | | | |
| පහතරට | රෙ | ගු | ං | ගු | ද | ං | ග | ත් | දෙ | ග | ත් | ත | ත | ක | දො | ං |
| සබරගමු | ජෙ | මි | කි | ට | කි | ටි | ත | ක් | ත | ක් | කි | ට | කි | ට | ජෙ | ං |

(ලකුණු 05)

03. (i) රාග විස්තරය ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, මුඛ්‍යාංග, ගායන සමය ආදි තොරතුරු ලියා තිබිය යුතුය. (ලකුණු 06)

(ii) මධ්‍ය ලය ගීතයේ ගීත ස්වර ප්‍රස්තාරය ලියා තිබිය යුතුය. (ලකුණු 06)

04. (i) | රි රි ස ස | නි නි ධ ධ | ප ධ නි ස | රි - - - | (ලකුණු 04)

(ii) ම, ප, ධ, නි, ස, රි, ග (ලකුණු 04)

(iii) ම, ප, ධ, නි, ස, රි, ග, ම (ලකුණු 04)

05. (i)  (ලකුණු 05)

(ii) 4/4 (ලකුණු 02)

(iii) Crochert , Minim (ලකුණු 05)

o6. (i)




(ලකුණු 04)

(ii) සයාහි, ලව, ගජරා, චාන්ටි, ගට්ඨා, ආදි ස්ථාන තබ්ලාවෙහි නියමිත ස්ථානවල සළකුණු කොට නම් කළ යුතුය. (ලකුණු 04)

(iii) A - දහිනා නා, තා, ති, ට, තිං, තුන්, තෙ

B - බායං ග, ගි, සෙ, කත්, ගෙ (ලකුණු 04)

07. (i) උතුරු ඉන්දීය සංගීතයේ ආභාෂය

රාග ආශ්‍රිත ගී තනු ඇතුළත් වීම

උතුරු ඉන්දීය සංගීත භාණ්ඩ භාවිතය

දොහොරා වැනි අංග ඇතුළත් වීම

(ලකුණු 04)

(ii) ජෝන් ද සිල්වා

චාල්ස් ඩයස් (ලකුණු 04)

(iii) දුටුගැමුණු , රාමායණය, සිරිසඟබෝ

දුටුගැමුණු - දන්නෝ බුදුන්ගේ

ශ්‍රී වික්‍රම - දන්න වංහුං

වෙස්සන්තර - අද වෙස්සන්තර රාජ පුතා

රාමායණය - දුටුවාද ස්වාමි (ලකුණු 04)

# පළමු වාර පරීක්ෂණය - 2018
# පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය
# 10 ශ්‍රේණිය

| | | | |
|---|---|---|---|
| 01. | (i) | ඔබ කැමති රාගයක සර්ගම් ගීතයක් හෝ මධ්‍යලය ගීතයක් ගයන්න. | (ලකුණු 05) |
| | (ii) | එහි තාලය නම් කරන්න. | (ලකුණු 05) |
| | (iii) | එම තාලය අතින් තාල තබන්න. | (ලකුණු 05) |
| | (iv) | එයට සමානව මාත්‍රා කැටිවන දේශීය තිත නම් කරන්න. | (ලකුණු 05) |
| 02. | (i) | ඔබ කැමති සරළ ගීතයක් ගයන්න. | (ලකුණු 05) |
| | (ii) | එහි මාත්‍රා විභාග වී ඇත්තේ කීයෙන් කීයට ද? | (ලකුණු 05) |
| | (iii) | ඔබ කැමති නූර්ති/ නාඩගම් ගීතයක් ගයන්න. | (ලකුණු 05) |
| | (iv) | එම නූර්තියේ /නාඩගමේ නම කියන්න. | (ලකුණු 05) |
| 03. | (i) | අවනද්ධ වාද්‍ය භාණ්ඩයකින් රිද්මය පවත්වා ගැනීම (ගුරුවරයා ගයන ගීතයට) | (ලකුණු 10) |
| | (ii) | එයට ගැලපෙන තාලයෙහි /තිතෙහි නම කියන්න. | (ලකුණු 10) |
| 04. | (i) | ස්වර පුවරුවෙන් සරළ ගීතයක් වාදනය කිරීම. | (ලකුණු 10) |
| | (ii) | කැමති භාණ්ඩයකින් ගීතයක් වාදනය කිරීම. | (ලකුණු 10) |
| 05. | (i) | ගොයම්, නෙළුම්, පතල්, එක් ගීතයක් ගායනය/ වාදනය කිරීම. | (ලකුණු 10) |
| | (ii) | වන්නම්, ප්‍රශස්ති, හටන් එක් ගීතයක් ගායනය/ වාදනය කිරීම. | (ලකුණු 10) |